**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය (ජීඑෆ්ඒටීඑම්) එච්අයිවී/ඒඩ්ස් නව මූල්‍යයන ආකෘතිය සංරචකය -2016**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ එච්අයිවී/ඒඩ්ස් මැලේරියා නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2015 නොවැම්බර් 26 දින එළඹි අංක 977-එල්කේඒ-එච්-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි. ශ්‍රී ලංකාවේ එච්අයිවී/ඒඩ්ස් වැලැක්වීම, පාලනය කිරීම, සහ ප්‍රතිකාර කිරීම සඳහා ජාතික වැඩසටහනේ කාර්යයන් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. නව මූල්‍යයන ආකෘතිය යටතේ එච්අයිවී/ඒඩ්ස් පාලනය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 5,323,102 ක් වූ සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. නව මූල්‍යයනය ආකෘති සංරචකය යටතේ ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**-------**

**තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ වාර්තා අනෙකුත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු සමඟ එකඟ වනබව, සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව,

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන සහ සපයන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වියදම රු.මිලියන 176.09 ක් වූ අතර තොරතුරු පහත දැක්වේ.

| වර්ගය | 2016 වර්ෂය තුළ දරන ලද වියදම | |
|---|---|---|
| | එජඩො | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 59,415 | 23,567,844, |
| එච්අයිපී/ඒඩ්ස් පාලන කටයුතු | 1,045,856 | 152,517,188 |
| | 1,105,271 | 176,085,032 |

**2.2.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පහත දැක්වේ.

| | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|
| | එජඩො | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | |
| විදේශ ආධාර ප්‍රධාන වලින් ලද මුදල් | **627,442** | **91,500,000** |
| දේශීය මූලාශ්‍ර වලින් ලද මුදල් | **89,145** | **13,000,000** |
| ගෝලීය අරමුදලෙන් ඍජු වියපැහැදම් | **407,557** | **59,434,020** |
| අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලැබුණු මුදල් | **288** | **42,000** |
| වැඩසටහන් වියදම් | **(1,045,856)** | **(152,517,188)** |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | **75,029** | **10,941,504** |
| ක්ෂය | **77,656** | **11,324,518** |
| ගෙවිය යුතු ශේෂ වැඩිවීම | **7,526** | **1,268,821** |
| ගෙවිය යුතු තැන්පතු අඩුවීම | **224** | **33,000** |
| විනිමය අලාභය | **(1,020)** | **-** |
| **මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල්** | **(159,415)** | **(23,567,844)** |
| ස්ථාවර වත්කම් | **(159,415)** | **(23,567,844)** |

| | | |
|---|---|---|
| **ආයෝජන කටයුතුවලට යොදාගත් ශුද්ධ මුදල්** | **(159,415)** | **(23,567,844)** |
| **-------------------------------------------** | | |
| **ආපසු යැවූ මුදල්** | **(3,547)** | **(517,328)** |
| **මූල්‍ය කටයුතුවල යොදාගත් ශුද්ධ මුදල්** | **(3,547)** | **(517,328)** |
| **ශුද්ධ මුදල් වැඩිවීම** | **නැත** | **නැත** |

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ එච්අයිවී/ඒඩ්ස් නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ කාර්යයන් 2016 ජනවාරි 01 සිට ආරම්භ කර තිබුණද, පෙර ව්‍යාපෘතිය විසින් 2015 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 69.99 කට ප්‍රසම්පාදනය කර රේඛීය අමාත්‍යාංශයට භාරදෙන ලද දේපල, පිරියත හා උපකරණ ව්‍යාපෘතියේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**-----------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**---------------------------**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, වර්ෂය තුළදී ලැබුණු අරමුදල් හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය කිරීම සඳහා එකඟවූ මුදල** | | **2016 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය** | **වර්ෂය තුළ ලද අරමුදල්** | | **2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය** | |
|---|---|---|---|---|---|---|---|
| | **එජඩො මිලියන** | **රු.මිලියන** | **එජඩො මිලියන** | **එජඩො මිලියන** | **රු.මිලියන** | **එජඩො මිලියන** | **රු.මිලියන** |
| ජීඑෆ්ඒටීඑම් | 5.32 | 707.56 | 2.50 | 1.03 | 150.42 | 0.91 | 132.9 |

ඉහත තොරතුරුවලට අනුව සංරචකය සඳහා වෙන්කරන ලද එ.ජ.ඩො මිලියන 5.32 කට සමාන රු.මිලියන 707.56 ක මුලු ප්‍රතිපාදනයෙන් 2016 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො මිලියන 0.91 කට සමාන රු.මිලියන 132.9 ක් එනම් මුලු ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවදුරටත් සමාලෝචිත කාල පරිච්ඡේදයේ විස්තරාත්මක අයවැය ලේඛනය තුල ක්‍රියාකාරකම් 93 ක් සඳහා වෙන්කරන ලද රු. මිලියන 143.29 ක් බලාපොරොත්තු වූ උක්ත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

ඊට අමතරව අයවැය ලේඛනයෙන් වෙනත් ක්‍රියාකාරකම් 34 ක් සඳහා වෙන්කරන ලද එකතුව රු.මිලියන 72.77 ක් වූ ප්‍රතිපාදනයෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 11.29 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුල මුළු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම පිළිබඳ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම ඉතාමත් දුරස්ථ බව නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

කාර්යසාධන බැදුම්කරයක් ලබාගැනීමකින් හා කොන්ත්‍රාත් ගිවිසුමකින් තොරව රු. මිලියන 14.85 ක පිරිවැයකට Automatic Micro Plate Elisa Reader Washer Machine 10 ක් ප්‍රසම්පාදනය කර තිබූ බව නිරීක්ෂණය විය. ලිංගික සම්ප්‍රේෂිත රෝග මධ්‍යස්ථානවලට බෙදාහැර තිබුණු මැෂින් 7 ක් 2017 ජූලි 03 දක්වා නිශ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ අඩුපාඩු

------------------------------

පහත සඳහන් පාලන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු.100,000 සීමාව ඉක්මවමින් අවස්ථා 24 කදී එකතුව රු. මිලියන 8.31 ක අතුරු අග්‍රිම නිලධාරීන්ට නිකුත් කර තිබුණි. අදාල කාර්ය නිම වූ වහාම අතුරු අග්‍රිම පියවීමට අවශ්‍ය වුවද අවස්ථා 10 කදී ලබාදුන් එකතුව රු. 93,301 ක වියදම් නොවූ අතුරු අග්‍රිම ශේෂ දින 24 සිට දින 97 ක ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. තවද අවස්ථා 3 කදී නිකුත් කරන ලද එකතුව රු.35,676 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය සඳහා යොදාගෙන නොතිබූ අතර දින 11 සිට දින 16 දක්වා ප්‍රමාදයකින් පියවා තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි. තවද ව්‍යාපෘතිය විසින් ආයතනවලට මාරුකරන ලද වත්කම් වල උපයෝජනය පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ව්‍යාපෘතිය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා සමලෝචිත වර්ෂය තුළ රු. මිලියන 4.89 ක මුදලක් ප්‍රතිපූර්නය කර තිබුණද, අනුමැතිය සහතික කිරීම සහ භාණ්ඩ ලැබීමට අදාල සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

විදේශීය නියෝජිත ආයතනයකින් 2016 සැප්තැම්බර් 21 දින ලැබී තිබුණු වටිනාකම එ.ජ.ඩො.145,026 ක් වූ පුරුෂ කොන්ඩම් ඒකක 6,120,000 කින් ඒකක 1,152,000 ක් අස්ථානගත වී තිබුණු බව වාර්තා වී ඇතත් ඒ පිළිබඳ විමර්ශනය කිරීමට ක්‍රියාකර නොතිබුණි.